# පළමුවන වාර පරීක්ෂණය - 2018
# 13 ශ්‍රේණිය
# පෙරදිග සංගීතය

**කාලය : පැය 2 යි.**

❖ **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.**

---

◆ **අංක 01 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතාම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන් තුළ ලියන්න.**

(01) සංගීත විෂය ශාස්ත්‍රීයව අධ්‍යයනය කරන ආධානිකයකු මුලින්ම සැලකිය යුතු අභ්‍යාසය වන්නේ,

(1) රාග අභ්‍යාසයයි. (2) ස්වර අභ්‍යාසයයි.
(3) තාල අභ්‍යාසයයි. (4) ආලාප අභ්‍යාසයයි.
(5) තාන අභ්‍යාසයයි. (........)

(02) රාගයක විස්තර හඳුනාගත හැකි ගායන විශේෂය වන්නේ,

(1) සර්ගම් ය. (2) ලක්‍ෂණ ගී ය. (3) ඛ්‍යාල් ය.
(4) වර්ණම් ය. (5) ධ්‍රැපද් ය. (........)

(03) ආධුනිකයකුට නිවැරදිව ශ්‍රැතියේ පිහිටා ගායනය කිරීමේ කුසලතාව වර්ධනය කර ගැනීමට වඩාත්ම යෝග්‍ය අභ්‍යාසය වන්නේ,

(1) ස්වසන අභ්‍යාසයයි. (2) තාල අභ්‍යාසයයි.
(3) ස්වර අභ්‍යාසයයි. (4) ගමක් අභ්‍යාසයයි.
(5) ආලාප අභ්‍යාසයයි. (........)

(04) මිනිස් සිරුර තුළ ඇති ශක්ති ස්ථාන හත හඳුන්වන නම වනුයේ,

(1) සක්‍ර නමිනි. (2) වක්‍ර නමිනි. (3) චක්‍ර නමිනි.
(4) මන්ත්‍ර නමිනි. (5) තන්ත්‍ර නමිනි. (........)

(05) සන්ධි ප්‍රකාශ රාගයන්හි,

(1) ''ධ හා රි'' යන ස්වර කෝමළ වේ. (2) ''ධ හා ග'' යන ස්වර කෝමළ වේ.
(3) ''ධ හා නි'' යන ස්වර කෝමළ වේ. (4) ''ධ හා <u>නි</u>'' ස්වර යෙදේ.
(5) ''ම<sup>।</sup>'' ස්වරය යෙදේ. (........)

(06) කෝට්ටේ යුගයෙහි ආරම්භ වී මහනුවර යුගයෙහි බෙහෙවින් පැතිර ගිය ගී විශේෂය වන්නේ,

(1) නාඩගම් ය. (2) සීගිරි ගී ය.
(3) දරු නැළවිලි ගී ය. (4) නූර්ති ගී ය.
(5) ප්‍රශස්ති ගී ය. (........)

(07) ශාස්ත්‍රීය ගායනයේ දී ගීතයේ වචන භාවිතා කරමින් ගායනයේ දී ආලාප ගායනය කිරීම,

(1) ස්වර ආලාපයයි. (2) බඩත් ආලපයි. (3) අකාරාදී ආලාපයි.
(4) බෝල් ආලාපයි. (5) පූර්වාලාපයි. (........)

(08) කිසියම් ස්වරයක් එහි දෙපස ඇති ස්වර ඇසුරු කොට ගනිමින් චලනය කොට ගැයීම,

(1) මූර්කි ය. (2) උපජ් ය. (3) ගමක් ය.

(4) මීන්ඩ් ය. (5) ගමක් ය. (.......)

(09) භාරතීය සංගීතයේ දක්නට ලැබුණු උතුරු ඉන්දියානු හා දකුණු ඉන්දියානු වශයෙන් වූ බෙදීම පිළිබඳ විස්තර ඇතුළත් කෘතිය,

(1) නාට්‍ය ශාස්ත්‍රයයි. (2) බෘහත්දේශි කෘතියයි.

(3) සංගීත රත්නාකරයයි. (4) විශ්ව සංගීත ක්‍ෂේත්‍රයයි.

(5) ස්වර මේලකලානිධියයි. (.......)

(10) ''මකාමත්'' සංගීතය යනු,

(1) බටහිර සංගීතයයි. (2) ඉස්ලාමික සංගීතයයි.

(3) ග්‍රීක සංගීතයයි. (4) චීන සංගීතයයි.

(5) භාරතීය සංගීතයයි. (.......)

(11) ආරෝහණයේ දී ''රි'' සහ ''ප'' දුර්වලව යෙදෙන පූර්වාංගවාදී රාගයකි.

(1) දේස් රාගය (2) ආශාවරී රාගය

(3) භාගේශ්‍රී රාගය (4) ජෞනපුරි රාගය

(5) තිලක්කාමෝද්රාගය (.......)

(12) රිෂභය මත න්‍යාසවන අවරෝහණයේ දී රිෂභය වක්‍රව යෙදෙන පූර්වාංගවාදී රාගයක් වන්නේ,

(1) දේස් රාගයයි. (2) ජයජයවන්ති රාගයයි.

(3) ආශාවරී රාගයයි. (4) තිලක්කාමෝද් රාගයයි.

(5) ජෞනපුරි රාගයයි. (.......)

(13) ඒක ස්වර (Melody) බහු ස්වර (Harmony) යන සංකල්ප දෙකට වඩාත්ම ගැළපෙන සංගීත සම්ප්‍රදායන් දෙක කුමක් ද?

(1) පෙරදිග හා කර්ණාටක (2) හින්දුස්ථානි හා කර්ණාටක

(3) හින්දුස්ථානි හා අපරදිග (4) අපරදිග හා පෙරදිග

(5) කර්ණාටක සහ දේශීය (.......)

(14) රි ම ප <u>නි</u> / <u>ධ</u> <u>ධ</u> ප ප / ම ප <u>ධ</u> ප / <u>ග</u> <u>ග</u> රි ස / යනුවෙන් සර්ගම් ගීය ආරම්භ කෙරෙන රාගයයි.

(1) භාගේශ්‍රී රාගයයි. (2) ජයජයවන්ති රාගයයි.

(3) ජෞනපුරි රාගයයි. (4) ආශාවරී රාගයයි.

(5) තිලක්කාමෝද් රාගයයි. (.......)

(15) රාගධාරි සංගීතය තුළ යෙදෙන ආනාසාතාත්මක සංගීතාංගය,

(1) ගමක් ය. (2) ආලාප ය. (3) තිහායි ය.

(4) මීන්ඩ් ය. (5) තානාලංකාර ය. (.......)

(16) ''ගීතං වාද්‍යං තථා නෘත්‍යං - ත්‍රයං සංගීත මුච්‍යතේ'' යනුවෙන් සංගීතය නිර්වචනය කර තිබෙන පැරණිම සංගීත ග්‍රන්ථය කුමක් ද?

(1) රාග තරංගිනි (2) ලක්ෂ්‍ය සංගීත්

(3) රාග විඥ්ඤාන (4) ක්‍රමික් පුස්තක් මාලිකා

(5) සංගීත රත්නාකරය (.......)

17. සදාරංග සහ අදාරංග යන සංගීතඥයින් දෙදෙනා විසින් ප්‍රචලිත කරන ලදගායන ශෛලිය කුමක් ද?

(1) ඛ්‍යාල් (2) ධමාර් (3) ධ්‍රැපද්

(4) චතුරංග (5) ගසල් (.......)

(18) ආරෝහණ, අවරෝහණ ක්‍රමය සෘජුවම භාවිතා කරන තාන් වර්ගය හඳුන්වන්නේ,

(1) කූටතාන් නමිනි. (2) ශුද්ධ හෙවත් සපට් නමිනි.

(3) බෝල්තාන් නමිනි. (4) වක්‍රතාන් නමිනි.

(5) මිශ්‍රතාන් නමිනි. (.......)

(19) ගති හා ලය වෙනස් වන මිතියෙන් සමානවන තාල යුගලයකි.

(1) ත්‍රිතාල් - පංජාබි (2) දීප්චන්දි - ධමාර්

(3) රූපයක් - දීප්චන්දි (4) ජප්තාල් - ධමාර්

(5) දාදරා - බෙම්ටො (.......)

(20) මාත්‍රා 3, 4 වශයෙන් ගොඩනැගෙන තිත් රූපය වන්නේ,

(1) මැදුම් මහ දෙතිතයි. (2) සුළු මැදුම් දෙතිතයි.

(3) දෙසුළු මැදුම් තුන්තිතයි. (4) සුළු මහ දෙතිතයි.

(5) මැදුම් මහ තුන්තිතයි. (.......)

(21) කටහඬෙහි ගුණාත්මක බව ඇති කිරීමට බලපාන ඉන්ද්‍රියක් වන්නේ,

(1) කර්ණේන්ද්‍රිය (2) ස්වරාලය (3) දරණකය

(4) මුද්ගරිකාව (5) කර්ණසංඛය (.......)

(22) ''හෙළ ගී මග'' හා ලංකාවේ සංගීත සම්භවය'' යන කෘතීන් දෙකෙහි කතෘවරුන් වන්නේ,

(1) ලයනල් රන්වල මයා හා දයා රත්නසේකර මයා

(2) රෝහණ බැද්දගේ මහයා හා බී. වික්ටර් පෙරේරා මයා

(3) ඩබ්.බී. මකුලොළුව මහතා හා සී. ද. එස්. කුලතිලක මයා

(4) පී.වී. නන්දසිරි මයා හා බී. වික්ටර් පෙරේරා මයා

(5) ප්‍රේමදාස මුදුන්කොටුව මයා හා ඩී.ආර්. පීරිස් මයා (.......)

(23) ජෞනපුරි රාගයට අදාළ නිවැරදි කියමන තෝරන්න.

(1) එහි වාදී හා සංවාදී ස්වර ''ධ'' සහ ''ග'' යන්න ය.

(2) එහි මේලය භෛරවී යන්න ය.

(3) ම ප ධ ධ ස̇ නි ධ ප යන ස්වර කොටසින් නිවැරදිව ආරෝහණ අවරෝහණ ලක්‍ෂණ මතුවීමයි.

(4) එය ඖඩව සම්පූර්ණ ජාති රාගයක් වීමයි.

(5) එහි ගායන සමය දිවා ප්‍රථම ප්‍රහරය වීම ය. (.........)

24. අපරදිග සංගීතය අනුව C Minor ස්කේලයට අයත් ස්වර හත පෙළගස්වන්නේ කෙසේද?

(1) C D $B^b$ F G $A^b$ $B^b$ (2) $C^\#$ D E $F^\#$ G $A^\#$ B

(3) C D $E^b$ F G A B (4) C D E $F^\#$ B A B

(5) C D E $F^\#$ G $A^b$ B (.......)

(25) පහත සඳහන් ගී වර්ග අතරෙන් මුළුමනින්ම අනාසාතාත්මක ගී වර්ග ඇතුළත් ගී සමුච්චය තෝරන්න.

(1) පාරු ගී, පතල් ගී, ටිකා සී පද
(2) පතල් ගී, පැල් ගී, ගොයම් ගී
(3) පතල් ගී, බඹර ගී, කෙළි ගී
(4) පාරු ගී, පැල් ගී, දැල් ගී
(5) පතල් ගී, පාරු ගී, පැල් ගී ( ........ )

- **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට අදාළ ගැලපෙන පිළිතුරු තෝරන්න.**

(26) මහනුවර රාජසභාවට අයත් නැටුම් ගැයුම් වැයුම් පැවැත්වූ ස්ථානය ........................................... ලෙස හැඳින්වේ.

(27) චීන සංගීතයේ විකාශනය යුගය ..................... කට බෙදෙයි.

(28) මධ්‍යමය සමය දර්ශක නැතහොත් .................................................. ස්වරය ලෙස හැඳින්වේ.

(29) වික්ටර් රත්නායකයන් ගායනය කරන ''හෝපළු වනපෙත'' ගීතය ........................................ රාගය ආශ්‍රිතව නිර්මාණය වූවකි.

(30) ඇමරිකානු මනෝවිද්‍යාඥයකු වන .................................................... 1987 දී බුද්ධි වර්ග 8 ක් හඳුන්වා දුන්නේ ය.

(31) නාඩගම් ගී සඳහා ................................................ තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගැනේ.


(32) ''තිරිකිට'' යන පදය දෙවරක්ම යෙදෙන නිර්දේශීත තාල පදය වන්නේ .......................................... තාලයයි.

(33) අලගනායිදු නම් ද්‍රවිඩ සංගීතඥයකු සම්බන්ධ වී ලංකාවේ නිපද වූ ප්‍රථම නාඩගම ...................................................... නාඩගමයි.

(34) දක්ෂිණ භාරතීය සංගීතයේ මේල ගණන ...................... කි.

(35) පැස්ටෝරල් (Pastoral) No: 06 සිම්ෆනිය .......................................................... සංගීතඥයාගේ නිර්මාණයකි.

◆ **අංක 36 - 40 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන ස්වර පුවරුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**




(36) ස්වර පුවරුවේ 1 - 6 - 9 - 13 යන අංක හිමි ස්වර හතර එකවර හැඬවූ විට නිකුත් වන කෝඩ් (chord) එක කුමක් ද?

(1) F - Major (2) F - Minor (3) C - Major

(4) C - Minor (5) G - Major ( )

(37) අපරදිග සංගීතයේ රේඛා මණ්ඩලයට (staff) අයත් රේඛා පහ මත පිහිටා ඇති ස්වර පහ පිළිවෙළින් අංකනය කරනුයේ,

(1) 3 - 6 - 10 - 13 - 16 (2) 4 - 7 - 11 - 14 - 17

(3) 5 - 8 - 12 - 15 - 18 (4) 6 - 9 - 13 - 16 - 19

(5) 7 - 10 - 14 - 17 - 20 ( )

(38) ආශාවරී රාගයේ වාදි - සංවාදී ස්වර පිළිවෙලින් දැක්වීමේ දී නිවැරදි අංක වන්නේ,

(1) 9, 4 (2) 9, 2 (3) 4, 9

(4) 2, 9 (5) 1, 6 ( )

(39) දේස් රාගයට අයත් ආරෝහණ ස්වර වල අංක පිළිවෙලින් දක්වන්නේ කෙසේද?

(1) 1 - 3 - 5 - 6 - 10 - 13 (2) 1 - 2 - 3 - 5 - 8 - 13

(3) 11 - 2 - 3 - 5 - 12 - 13 (4) 1 - 3 - 6 - 8 - 12 - 13

(5) 1 - 3 - 5 - 8 - 12 - 13 ( )

(40) ආසාවරී මේලයට අයත් ස්වර අංක පිළිවෙලින් දක්වන්නේ කෙසේ ද?

(1) 1 - 2 - 3 - 4 - 6 - 7 - 10 (2) 1 - 3 - 4 - 6 - 8 - 9 - 11

(3) 1 - 3 - 5 - 6 - 8 - 10 - 12 (4) 1 - 3 - 5 - 7 - 9 - 10 - 12

(5) 1 - 4 - 5 - 7 - 9 - 10 - 13 ( )

- **අංක 41 - 45 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

(41) ''පුරණ සමුදුර දුවන නැව් දකලා'' යන ප්‍රශස්ති ගීතයට අයත් තිත් රූපය ලියන්න.

.............................................................................................................................................

(42) සුළු මහ දෙතිතට අයත් ඔබ උගත් වන්නමක් නම් කරන්න.

.............................................................................................................................................

(43) රාජ සභාවට අයත් සංගීත නැටුම් ආයතන දෙකක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(44) අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය තුළ ග්ලොකන්ස්පීල් සහ සයිලෆෝන් යන සංගීත භාණ්ඩ දෙක අයත්වන්නේ කුමන භාණ්ඩ වර්ගයට ද?

.............................................................................................................................................

(45) ''ලෝනාමුණි රාජගේ'' ගීතය ඇසුරු කරගත් රාගය කුමක් ද?

.............................................................................................................................................

- **අංක 46 සිට 50 තෙක් හිස්තැන් පිරවීම සඳහා පහත වගුවේ විස්තර අදාළ කරගන්න.**

| A | B | C |
|---|---|---|
| • ආරෝහණයේ ''ග'' සහ ''ධ'' දුර්වල ය. | • ස්පධ මීන්ඩ් ලෙස යෙදේ.<br>• වාදි සංවාදි ස්වර ''ම'' ''ස'' වන අතර මධ්‍යම රාත්‍රියේදී ගයයි. | • ආරෝහණයේ ''ග'' හා ''නි'' වර්ජිතය. |

ඉහත A තීරුවට අදාළ රාගය (41) .......................................... රාගය වන අතර, B තීරුවට අදාළ රාග දෙකක් වන්නේ (47) ...................................... රාගය සහ (48) ......................................... රාගයි. C තීරුවට අදාළ රාගය වනුයේ (49) ............................................. රාගයයි. ඉහත වගුවේ ඇති සමප්‍රකෘති රාග දෙකෙහි නාමයන් වන්නේ (50) ............................................... යන රාග දෙකයි.

# පළමුවන වාර පරීක්ෂණය - 2018
## 13 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය - II කොටස

**කාලය : පැය 3 යි.**

❖ **I කොටසින් ප්‍රශ්න දෙකකට ද, II කොටසින් එක් ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද වශයෙන් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

---

### I කොටස

(01) පහත සඳහන් ස්වර සංගතීන් කුමන රාගයන්ට අයත් දැයි නම් කරන්න.

(a) රි ම ප ධ , ම ග රි , ග නි̣ ස

(b) ම ධ නි̲ ධ , ම , ග̲ රි ස

(c) රි ම ප , නි̲ ධ̲ ප

(d) රි ග̲ රි ස , නි̣ ස ධ̣ නි̲ , රි

(i) ඉහත රාග 4 හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිවෙලින් නම් කරන්න. (ල. 8)

(ii) ඉහත රාග අතුරෙන් ඛමාජ් මේලගත රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාරගත කරන්න. (ල. 5)

(iii) B හෝ C රාග අතරින් එක් රාගයකට අයත් ස්වර සංගතියක් ලියා දක්වන්න. (ල. 3)

(iv) ඉහත රාග අතරින් ඔබ කැමති රාගයකට අදාලව මාත්‍රා 8 නොඅඩු තානාලංකාර 2 ක් ලියන්න. (ල. 4)

(02) (i) නිර්දේශිත රාග කිහිපයකට අදාල කරගත හැකි තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(a) අවරෝහණයෙහි රිෂභය වක්‍රවන ඛමාජ් මේලගත රාගය

(b) ධ̲ - ග̲ වාදී හා සංවාදීව යෙදෙන ඖඩව සම්පූර්ණ රාගය

(c) නිර්දේශිත රාග අතුරින් කාෆි මේලගත රාගය නම් කරන්න.

(d) ආරෝහනයේ දී ගාන්ධාරය සහ ධෛවකය වර්ජිත වන රාත්‍රී 2 වන ප්‍රහරයේ ගැයෙන රාගය නම් කරන්න. (ල. 8)

(ii) (b) සහ (d) රාගවලට ගැලපෙන සම්ප්‍රකෘති රාග නම් කරන්න. (ල. 4)

(iii) බාගේශ්‍රී හෝ ආශාවරී යන රාග අතුරින් ඔබ කැමති රාගයකට අදාලව මේලය, ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී, ජාතිය, ගානසමය සහ මුඛ්‍යාංගය ලියා දක්වන්න. (ල. )

(iv) a, b, c, d අක්ෂරවලට අදාළ රාග අතුරින් ඔබ කැමති රාගයකට ස්වර 20 ට නොඅඩු වන ලෙස ආලාප ඛණ්ඩයක් ලියා දක්වන්න. (ල. )

(03) (i) පහත දැක්වෙනුයේ නිර්දේශි තාල පහකට අයත් තොරතුරු වගුවකි.

| අවනද්ධාක්ෂර | තාලයේ නම | මාත්‍රා ගණන | තාල සංඛේත පිළිවෙල | තාල වාද්‍ය භාණ්ඩය |
|---|---|---|---|---|
| ධි ධි නා | A ......................... | 10 | B ...................... | තබ්ලාව |
| ධා තිං තිං තා | C ......................... | D .................... | x 2 0 3 | E ...................... |
| ධාගේ තිරිකිට | F ......................... | G ..................... | H ...................... | තබ්ලාව |
| ධා ධී නා | I ......................... | 6 | J ......................... | තබ්ලාව |
| ගධි ගිත | K ......................... | 12 | x 0 2 0 3 4 | L ...................... |

(ල. 12)

(ii) ඉහත K තාලය භාවිතා කරන ගායන ශෛලිය නම් කර එම ශෛලියෙහි ලක්ෂණ 3 ක් නම් කරන්න. (ල. 4)

(iii) F තාලය තාල සංඛේත සහිතව ප්‍රස්තාර ගත කරන්න. (ල. 4)

## II කොටස

(04) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග ශෛලීන්දෙකකට අදාළ තොරතුරු පහත දැක්වේ.

(i) කෘෂිකර්මය හා සම්බන්ධ සශ්‍රීකත්වය හා බැඳී තිබේ.

(ii) පරයාගේ චරිතය රඟ දක්වනු ලැබේ.

(iii) පාට වරුණ පුත ...... පරමණ්ඩල පුත

(iv) සබේ විදානේ චරිතයට ප්‍රධාන තැනක් හිමිවේ.

(v) උඩරට ගැටබෙරය වාදනය කරයි.

(vi) ගම්භිර කාලිංග නුවර නිරිඳුගේ වාසල

(vii) තනු රටා උඩරට ශාන්ත කර්ම හා සම්බන්ධ වේ.

(viii) පහතරට නර්තන අංගයන්ගෙන් පෝෂණය වී ඇත.

(ix) රංගභූමිය තානායම්පල ලෙසින් හැඳින්වේ.

(x) රංගභූමිය ලෙස කමත යොදා ගනී.

(xi) පහතරට බෙරය සහ හොරණෑව භාවිතා කරයි.

(xii) විවිධ චරිත හාස්‍යයට ලක්කෙරේ.

| A<br>........... රංග ශෛලිය | B<br>............ රංග ශෛලිය |
|---|---|
| | |

(i) ඉහත රංග ශෛලීන් දෙක නම්කර A හා B අක්ෂර යටතේ වගගුත කරන්න. (ල. 8)

(ii) ඉහත රංග ශෛලීන් දෙකට අමතරව ඔබ උගත් වෙනත් රංග ශෛලියකට (විෂය නිර්දේශයට අයත්) නාට්‍යමය හා සංගීතමය ලක්ෂණ 08 ක් ලියා දක්වන්න. (ල. 8)

(iii) ඔබ කැමති එක් රංග ශෛලියකට අයත් ප්‍රචලිත ගීයක මුල් කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 4)

(05) ශ්‍රී ලාංකීය ජන සංගීතය ගැමි ගී හා සේ ගී වශයෙන් කොටස් 2 කි. මින් ගැමි ගී බොහොමයක් අනාඝාතාත්මක ය.

(i) අනාඝාතාත්මක ගැමි ගී වර්ග 5 නම් කරන්න. (ල. 5)

(ii) ඔබ නම් කළ මෙහි ගී වර්ගවල මුල් පාදයන් ලියා දක්වන්න. (ල. 5)

(iii) ගැමි ගී හා සේ ගී සන්දන්දනාත්මකව විස්තර කරන්න. (කරුණු 5 සැහේ) (ල. 5)

(iv) ප්‍රශස්ති ගීතයක් හෝ හටන් ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 5)

## III කොටස

(06) එක් මාතෘකාවකට කරුණු පහක් ඇතුළත් වන සේ පහත සඳහන් මාතෘකා 4 ක් පිළිබඳ අවශ්‍ය උදාහරණ සහිතව විස්තර කරන්න.

(i) ආලාප හා ආලාප වර්‍ගී (iv) හෙළ ගී මග

(ii) ගානසමය (v) වැදි ගී

(iii) ගසල් ගායන ශෛලිය (iv) මීන්ඩ් (ල. 20)

(07) පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

(i) ( | + ධ ස රි | ග - - ම | පධ පම ගම පම | ග - - - | ) (ල. 8)

(ii) දී ඇති ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් ලියා දක්වන්න. (ල. 4)

(iii) C major, D major chords වලට අදාල ස්වර ලියන්න. (ල. 4)

(iv) F major සහ G major ස්කේලයන්ට අදාළව ස්වර ලියා දක්වන්න. (ල. 4)

(08) බටහිර සම්භාව්‍ය සංගීතයේදී ඔපෙරා සංධ්වනි හා මුද්‍රා නාට්‍ය වලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

(i) ඔපෙරා යන්න හඳුන්වන්න. (ල. 5)

(ii) මුද්‍රා නාට්‍යයක් තුළ සංගීතයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 5)

(iii) සංධ්වනියක් (symphony) යන්න හඳුන්වා විශේෂ ලක්ෂණ 5 ක් ලියන්න. (ල. 5)

(iv) ඔබ කැමති බටහිර සංගීතඥයෙක් පිළිබඳ කරුණු 5 ක් ලියා දක්වන්න. (ල. 5)